ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව** |
| දිනය | **2018 ඔක්තෝබර් 26** |

## ශ්‍රී ලංකා රජය මගින් සක්‍රීය වගකීම් කළමනාකරණය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ පිටතදී රුපියල් බිලියන 310ක් ණය වශයෙන් ලබා ගැනීම සඳහා වූ යෝජනාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

"2018 අංක 8 දරන, සක්‍රීය වගකීම් කළමනාකරණ පනතේ විධිවිධානයන්හි විශේෂිතව සඳහන් කර ඇති අරමුණු උදෙසා, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටතදී, ශ්‍රී ලංකා රජය විසින් රුපියල් බිලියන 310 නොඉක්මවූ මුදලක් ණයක් වශයෙන් ලබාගැනීමට" එම පනතේ 3 වැනි වගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින්, 2018.10.26 වැනි දින යෝජනා සම්මත කරන ලදී.

දේශීය හා විදේශීය මුදල් වලින් නාමනය කරන ලද සිය නොපියවූ ණය වගකීම් පිළිබඳව, ශ්‍රී ලංකා රජය මනාව දැනුම්වත්වී ඇත. ඇතිවිය හැකි දේශීය හා විදේශීය කම්පනවල බලපෑම මධ්‍යයේ, විධිමත්ව හා ක්‍රමානුකූලව ණය සේවාකරණයේ යෙදෙමින් සාර්ව ආර්ථික ස්ථාවරත්වය ළඟා කරගැනීම සඳහා රටෙහි ණය කළඹ විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමට අවශ්‍ය නීතිමය රාමුව ආයතනගත කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින්, 2018 මාර්තු මාසයේදී පාර්ලිමේන්තුව විසින් සක්‍රීය වගකීම් කළමනාකරණ පනත නීතිගත කරන ලදී. 1949 අංක 58 දරණ මුදල් නීති පනත, දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත (417 වැනි පරිච්ඡේදය), ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත (420 වැනි පරිච්ඡේදය) හා 1957 අංක 29 දරණ විදේශ ණය පනත වැනි නීතිවලට අනුකූලව රාජ්‍ය ණය කළමනාකරණය කිරීම සඳහා, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටතදී ණය ලබාගැනීමට අවශ්‍ය කරන නීතිමය රාමුව, සක්‍රීය වගකීම් කළමනාකරණ පනත මගින් ශ්‍රී ලංකා රජයට සැපයෙනු ඇත.

ශ්‍රී ලංකා රජයේ සක්‍රීය වගකීම් කළමනාකරණ රාමුවෙහි අවධානය යොමු වී ඇත්තේ, වාර්ෂික විසර්ජන පනතෙන් ආවරණය වන මූල්‍ය වර්ෂයට ඔබ්බෙන් වූ ණය ගෙවීම් ප්‍රතිමූල්‍යනය හා /හෝ පෙරමූල්‍යනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කල් ඇතිව ගැනීම කෙරෙහිය. ශ්‍රී ලංකා රජය විසින් සක්‍රීය වගකීම් කළමනාකරණ උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීම සැලසුම් කර ඇත්තේ රජයේ මුදල් ප්‍රවාහයන්ගේ විචලනය, පවතින හා අපේක්ෂිත පොලී අනුපාතිකයන් සහ ඉදිරි කාලය තුළ ඇති

රාජ්‍ය ණය කල් පිරීම් වලට අනුකූලව සුමට ලෙස ණය ගෙවීම් සිදු කිරීම හා ඒවා හැකි අවම පිරිවැයක් යටතේ සිදුකිරීම සහතික කරගැනීමටය.

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සක්‍රීය වගකීම් කළමනාකරණ රාමුව සමඟ එක්ව සක්‍රීය වගකීම් කළමනාකරණය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටතදී රුපියල් බිලියන 310 ක් දක්වා ණය ලබාගැනීමේ යෝජනාව පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමත් සමඟ, වෙළඳපොළ තත්ත්වයන්ට අනුකූලව අවශ්‍ය උපායමාර්ග ගැනීමට ශ්‍රී ලංකා රජයට සහ ශ්‍රී ලංකා මහ බැංකුවට බෙහෙවින් අවශ්‍යව තිබූ නීති රාමුව සකස් විය. ඒ අනුව, පහත දැක්වෙන ප්‍රධාන උපාය මාර්ග ඇතුළුව තවත් උපාය මාර්ග අනුගමනය කෙරේ.

අ) හඳුනාගත් ණය ආපසු මිලදී ගැනීම හෝ කල් පිරීමට පෙර නැවත ගෙවීම.

ආ) ඉහළ පොලී අනුපාතිකයන් යටතේ ලබාගත් නොපිය වූ ණය ගෙවීම සඳහා, අඩු පොලී අනුපාතිකයන් යටතේ නව ණය ලබා ගැනීම.

ඇ) මාරු කිරීම් හා හුවමාරු කිරීම් හරහා නව කොන්දේසි යටතේ, හඳුනා ගත් ණයවල කල් පිරීමේ හෝ ආපසු ගෙවීමේ කාලය දිගු කර ගැනීම.

ඈ) හඳුනාගත් ණය, නව කොන්දේසි යටතේ නව ණය බවට ඒකාබද්ධ කිරීම හෝ පරිවර්තනය කිරීම.

ඉ) පවතින හිතකර වෙළඳපොළ තත්ත්වයන්ගේ ප්‍රතිලාභ ලබාගැනීමට, පාර්ලිමේන්තුව විසින් වාර්ෂික විසර්ජන පනත යටතේ අදාළ වර්ෂයට අනුමත කරන ලද ණය ගැනීමේ සීමාව ඉක්මවා යමින් ණය ලබා ගැනීම සහ එවැනි ලැබීම්, දැනට පවතින සාපේක්ෂව ඉහල පිරිවැයක් සහිත ණය කලින් ගෙවා නිම කිරීම සඳහා යොදා ගැනීම.

ඊ) හඳුනාගත් කාර්යයන් සඳහා පමණක් වෙන්කළ බැංකු ගිණුම් පවත්වාගෙන යාම. එනම් සක්‍රීය වගකීම් කළමනාකරණ පනතේ 3 වන වගන්තියට අනුකූලව, පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවට අනුව වගකීම් කළමනාකරණය වෙනුවෙන්ම වෙන් කරන ලද රුපියල් හා විදේශ මුදල් ඒකක වලින් නාමනය කරන ලද ගිණුම් පවත්වාගෙන යාම.

උ) ඉහත සඳහන් කල බැංකු ගිණුම් වල මුදල් අතිරික්ත, ඉහළ ද්‍රවශීලතාවයෙන් යුතු සුදුසු වත්කම් වල ආයෝජනය.

සක්‍රීය වගකීම් කළමනාකරණ පනත යටතේ ඇති නීතිමය රාමුව තුළ සකස් කර ඇති සක්‍රීය වගකීම් කළමනාකරණ උපායමාර්ග යටතේ චීන පැන්ඩා, ජපන් සමුරායි සහ ඉතා ද්‍රවශීලී සුකුක් වැනි වෙළඳපොළවල් වෙත පිවිසෙමින් වෙළෙඳපොළ පදනම් කරගත් විදේශ අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මේ වනවිටත් ගෙන ඇත. සක්‍රීය වගකීම් කළමනාකරණ උපාය මාර්ග මගින්, පිරිවැය ඵලදායීතාවය උපරිම වන අයුරින් ඉදිරි වසරවලදී ප්‍රතිමූල්‍යන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සක්‍රීයව කටයුතු කිරීම හා දේශීය හා විදේශීය ණය කල්පිරීමේ කාලය දීර්ඝ කිරීමට උපරිම දායකත්වයක් ලැබෙනු ඇති බවට ශ්‍රී ලංකා රජය හා ශ්‍රී ලංකා මහ බැංකුව විශ්වාස කරයි.